සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය | පැය 01 යි |
| கண்டுபிடிப்பு சோதனை | 01 மணி நேரம் |
| Diagnostic Test | 01 Hour |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | 10 ශ්‍රේණිය |
| சிங்கள மொழி மற்றும் இலக்கியம் | தரம் 10 |
| Sinhala language and literature | Grade 10 |

**උපදෙස් :**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශන් වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.  මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

- පහත දැක්වෙන ප්‍රකාශවල ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(01) ව්‍යාපාරිකයා සේවකයන්ගේ <u>අත් පා බැඳ තියා</u> වැඩ කරන්නේ යැයි සමහරු කියති.

1. නිදහස නැති කර
2. ඉල්ලීම් නොසලකා
3. අයිතීන්ට ඉඩ දී
4. වැටුප් දීමනා නොගෙවා

(02) ඔහු අප සියලු දෙනාගේ අභිවෘද්ධිය තකා <u>ආත්ම පරිත්‍යාගයෙන්</u> කටයුතු කළේ ය.

1. තම නිදහස ගැන සිතා
2. සියලුම ධනය වැය කරමින්
3. අප දිරි ගන්වමින්
4. සිය යහපත ගැන නොසලකා

(03) එම සිද්ධිය පිළිබඳව තමා <u>හාන්කවිසියක්වත්</u> නොදන්නා බව චූදිතයා ප්‍රකාශ කළේ ය.

1. ආරංචියක්
2. විමසා දැනගත් දෙයක්
3. සත්‍ය තොරතුරක්
4. කිසිදු තොරතුරක්

- 04 සහ 05 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න

(04) සිංහල කාව්‍යය සම්ප්‍රදාය ගැන ලියූ ............ ග්‍රන්ථයට විශේෂ පරිත්‍යාගයක් පිරිනැමිණි.

1. පරීක්ෂණ
2. නිර්මාණ
3. නිරීක්ෂණ
4. ප්‍රකාශන

(05) අධ්‍යාපනය යන්නට ............ ඉදිරිපත් කළ විශාරදයන් අතර සොක්‍රටීස්ට වැදගත් තැනක් හිමිවේ.

1. නිර්දේශ
2. නිර්වචන
3. නිර්මාණ
4. නිර්දිෂ්ට

- **06 සිට 12 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන්න.**

(06) අකාරාදී පිළිවෙළට නම් යෙදී ඇති පද පේළිය තෝරන්න

1. පූජාවලිය, අමාවතුර, බුත්සරණ, ජාතක පොත
2. හංවැල්ල, කොළඹ, ගාලල්, මහනුවර
3. පරාක්‍රමබාහු, විජයබාහු, දුටුගැමුණු, කාවන්තිස්ස
4. ඉන්දුමතී, කීර්තිලතා, පබසරා, වරුණි

(07) අඹු-දරු යන යුගල පදයෙහි අර්ථයෙහි ඇති සබඳතාවය වන්නේ,

අර්ථයෙන් වැඩි ය. 2. අර්ථයෙන් අඩු ය.

3. අර්ථයෙන් වෙනස් ය. 4. අර්ථයෙන් විරුද්ධ ය.

(08) පහත සඳහන් පද අතුරින් හැම පදයකම අක්ෂර නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. සීඝ්‍රගාමී, ප්‍රශ්න, කොට්ඨාශය, මර්දනය
2. මර්දනය, වර්දනය, ඖෂධ, ප්‍රදානෝත්සවය
3. පිළිවෙළ, ශීඝ්‍රගාමී, ඖෂධ, ප්‍රධානෝත්සවය
4. ශීඝ්‍රගාමී, පිළිවෙළ, කොට්ඨාසය, උලෙළ

(09) මිශ්‍ර ක්‍රියා අර්ථයක් දෙන පදයක් ඇතුළත් වාක්‍යය තෝරන්න.

1. පොත කියවූ ළමයා වාඩිවිය.
2. සැම දෙනාටම සුබ අනාගතයක් වේවාෟ
3. කුඩා දරුවා හඬ හඬා සිටියි.
4. වැසි වසිද්දී ගොවියෝ ගෙවල් කරා ගියහ.

(10) "ගොවියෝ වී වපුරති" මෙහි වපුරති යන පදයේ කර්ම කාරක අතීත කාල ප්‍රථම පුරුෂ ඒක වචන ක්‍රියා පදය කුමක්ද?

1. වපුරනු ලැබූහ 2. වැපිරිණි 3. වැපිරෙති 4. වපුරමි

(11) "හෙළදිව අතීත ප්‍රතිරාව" කෘතිය රචනා කළ ලේඛකයා වන්නේ,

1. ආනන්ද ගුරුගේ ය. 2. ආනන්ද රාජකරුණා ය.

3. අභය හේවාවසම් ය. 4. ආනන්ද සිල්වා ය.

(12) දී ඇති අක්ෂර ගැළපීමෙන් සූචනය වන නිවැරදි ග්‍රන්ථ නාමය වන්නේ,

1. ගයම්රලිප 2. ඥකැහලෑ 3. ලිකගයුච 4. තුමහංයදි

- **අක්ෂර මාලාව ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(13) පහත දැක්වෙන අක්ෂර අතුරින් හ්‍රස්ව අක්ෂර පමණක් ඇතුළත් වරණය වන්නේ,

1. ඌ, ඒ, අ 2. ඕ, අ, ආ 3. ඇ, ඉ, ඊ 4. උ, අ, ඍ

(14) අර්ධ ස්වර පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

1. ය, ණ　　2. ව, ල　　3. ල, ද　　4. ඤ, ණ

(15) මූර්ධජ අක්ෂර හා ඕෂ්ඨජ අක්ෂර අයත් නොවන වරණය කුමක් ද?

1. ම, ප　　2. ණ, බ　　3. ර, ව　　4. ක, ත

(16) හෙළ වර්ණ මාලාවේ අඝෝෂ අක්ෂර ගණන වන්නේ,

1. 16　　2. 18　　3. 15　　4. 20

- 17 සහ 18 ප්‍රශ්න සඳහා ප්‍රාදේශික ව්‍යවහාර ගැන සැලකිලිමත් වෙමින් පිළිතුරු සපයන්න.

(17) "සිංහල ජනවහර" කෘතියට අනුව මොනරාගල ප්‍රදේශයේ පුහුල් යන්වෙන් හඳුන්වන්නේ,

1. කිරිඅල　　2. වට්ටක්කා　　3. කැකිරි　　4. පිපිඤ්ඤා

(18) "බීවා" යන පදය උඩරට ජනවහරට අනුව ව්‍යවහාර වනුයේ,

සුන්නා　　2. මන්නා　　3. පන්නා　　4. බුන්නා

(19) සාහිත්‍ය නිර්මාණයක වස්තු විෂය යනුවෙන් අදහස් කරන්නේ,

1. නිර්මාණකරුගේ නිපුණ බව යි.

2. නිර්මාණකරුගේ නිර්මාණශීලීත්වය යි.

3. නිර්මාණකරුගේ ජීවන දෘෂ්ටිය යි.

4. නිර්මාණකරු ලබන අත්දැකීම යි.

- ප්‍රශ්න අංක 20 සහ 21 ප්‍රශ්නවලට අදාළව ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

(20) උක්ත ආඛ්‍යාතය නිවැරදිව ගළපා ඇති වාක්‍යය තෝරන්න.

1. ළමයි විසිදෙනෙකු චාරිකාව යති.　　2. මා එම වැඩය නොකළෙමි.

3. මිනිසුන් පාරේ ගමන් කරති.　　4. ගවයන් විසින් තණ කනු ලබයි.

(21) නිවැරදි කර්මකාරක වාක්‍යයක් වන්නේ,

1. ළමයින් විසින් පොත් බැලෙති.　　2. පියා විසින් මම කැඳවනු ලබමි.

3. රියදුරා විසින් බසය පදවනු ලැබූහ.　　4. ගොවියන් විසින් ගවයන් බැඳෙති.

- ප්‍රශ්න අංක 22 සිට 24 තෙක් දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ සහිත වරණය තෝරන්න.

(22) ආරම්භ කළ දේ අවසන් කළ යුතුය.

1. කිතුල් ගහට ගිය මිනිහටත් කියන්න දෙයක් තිබුණාලු.

2. ගැනුන් බෝවේ කළගෙඩි වේලේ.

3. බැඳගත් බෙරේ ගහන්න ඕනෑ.

4. ජරමර අස්සේ බර කරතත්.

(23) බොරු උපාසකකම් පෑම.

1. කිඹුල් කඳුළු හෙළීම.

2. කණුවයි ලණුවයි වගේ.

3. කපුරාල මස් නොකා හොදි පමණක් කෑම.

4. කපන්න බැරි අත සිඹීම.

(24) වැරදි දේ දැක දැක එම වැරදි වලට අනුබල දීම.

1. කළ හොඳ පස්සෙන් එනවා වගෙයි.

2. පනින රිලවුන්ට ඉනිමං බැන්දා වගෙයි

3. බල්ලගේ වැඩේ බූරුවා භාරගත්තා වගෙයි

4. අත දීලා දත නියෙවුවා වගෙයි

- **අංක 25 සිට 26 තෙක් දී ඇති ප්‍රකාශනවල ඉරි ඇඳි පදය සඳහා වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(25) නාවික යාත්‍රාව ගිනි ගැනීම නිසා ජලජ පැළෑටි රසක් විනාශ වූ බව පරිසරවේදීහු කීහ.

1. ජලයෙහි ජීවත් වන

2. ජලයෙහි හැසිරෙන

3. ජලයට සමීප

4. ජලයෙහි උපන්

(26) යුධ පිටිය පුරා හේෂාරාවය පැතිරිණ.

ඇතුන්ගේ නාදය 2. අශ්වයන්ගේ නාදය 3. සෙබළුන්ගේ නාදය 4. සතුරන්ගේ නාදය

- **අංක 27, 28, 29 තෙක් ඇති ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටස කවර ව්‍යාකරණ ගණයකට අයත්දැයි තෝරන්න.**

(27) කුකුළන් හඬලද්දී අපි දළදා මාළිගාවට ළඟා වුණෙමු
1. ප්‍රයෝජන ක්‍රියාවකි 2.මිශ්‍ර ක්‍රියාවකි
3 කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි 4. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි

(28) නංගී අඬ අඬා බත් කෑවා යි

1. මිශ්‍ර ක්‍රියාවකි. 2. පූර්ව ක්‍රියාවකි. 3. අසම්භාව්‍ය ක්‍රියාවකි 4. ශුද්ධ ක්‍රියාවකි.

(29) නුඹලා ප්‍රවේශමෙන් වැඩ කරපල්ලා' යි සීයා කීවේය.
1 විධික්‍රියාවකි 2. ආශිවර්ාද ක්‍රියාවකි 3. ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි 4. මිශ්‍ර ක්‍රියාවකි
(30) හිරු බැස යද්දී තාත්තා කුඹුරෙන් ගොඩට පැමිණ අම්මා සමඟ කතා කරමින් නිවස දෙසට ගියේය. ඉහත වාක්‍යයේ තද කළු අකුරින් දැක්වෙන ක්‍රියා වර්ග අනුපිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

1. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා 3. අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
2 පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා 4.අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා

- **අංක 31 හා 32 ප්‍රශ්නවල එක් එක් පේළියේ දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.**

(31) 1. අභිරුචිය - කැමැත්ත, උපහාරය, ආචාරය, අපවාදය
2. සමුද්‍රය - සාගරය, මුහුද, ජලනිධි, සරසි
3. උදක - අඹ, දිය, ජලය, පැන්
4. වාලුකා - පුලින, මරු, වැලි, යළි

(32) 1. කනක - කාංචන, කසුන්, රන්, ස්වර්ණ
2. නෙළුම් - පංකජ, සියපත්, පද්ම, උපුල්
3. වරල - කෙස්, කියඹු, කේෂ, තටුව
4. අරම - ආරාමය, වෙහෙර, විහාරය, ආරණ්‍ය

- අංක 33 හා 34 ප්‍රශ්න වල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(33) 1. මධ්‍ය - ආදී, අන්ත, අමධ්‍ය, විමධ්‍ය
2. ආයාසය - උත්සාහය, උනන්දුව, උද්යෝගය, ප්‍රයාසය
3. වර්ධනය - දියුණුව, සංවර්ධනය, අභිවර්ධනය, ප්‍රවර්ධනය
4. ප්‍රදානය - පිරිනැමීම, පිදීම, පරිත්‍යාගය, ප්‍රතිග්‍රහණය

(34) 1. ආරම්භය - ප්‍රාරම්භය, සමාරම්භය, අවලම්භය, විපුලම්භය
2. නිරර්ථක - අනර්ථ, ව්‍යාර්ථ, ව්‍යර්ථ, අසාර්ථක
3. අපරභාග - විභාග, සභාග, දශමභාග, පූර්වභාග
4. පරිපූර්ණ - පිරිපුන්, පරිනත, පරිමිත, පිරිබුන්

(35) දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට ගැළපෙන පිළිතුරක් සහත වරණය තෝරන්න.

1.නිපාත - දක්වා, තුරු, පටන්, නා
2. උපසර්ග - අභිමන්, උපනායක, සංවර්ධන, වරණය
3. ක්‍රියා පද - හඬ හඬා, බලමින්, නටන්නී, දුවනු
4. උක්ත පද - මහල්ලෙක්, කොල්ලා, මිනිසෙකු, අම්මා

(36) පහත (අ) කොටසේ දැක්වෙන ක්‍රියා නාමය සමඟ (ආ) කොටසේ දැක්වෙන ක්‍රියාපද නිවැරදිව ගැළපෙන වරණය තෝරන්න.

| අ | ආ |
|---|---|
| A මිශ්‍ර ක්‍රියා | E බැස |
| B පූර්ව ක්‍රියා | F නටනමින් |
| C විධි ක්‍රියා | G බොනු |
| D ආශිර්වාද ක්‍රියා | H සෙත්වේවා |

1. A G 2. B E 3. C H 4. D F

- අංක 37 සිට 38 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයේ ඇතුළත් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

(37) 1. සතුරෝ තම රාජ්‍යයට පහරදෙති' යි රජතුමා සිතුවේ ය.
2. ඇමතිතුමා උත්සවයට සහභාගී වූහ.
3. ඕ තොමෝ තම සතුට ප්‍රකාශ කළහ.
4. දැරියක් මහ මඟ හඬමින් ගමන් කළාය.

(38)

1. කොතෙක් උගත්කම ඇති ද කෙනෙක් පවටම බර වෙති.
2. වැඩිහිටියන් බාලයන්ට අවවාද දී යහමග යවති.
3. හෙළ කලාකරුවෝ අතින් ශ්‍රේෂ්ඨ නිර්මාණ බිහි වී ඇත.
4. සතුන් පොළොවේ දෙපා ගැටීම වැනි ශාරීරික ක්‍රියා මගින් පණිවිඩ හුවමාරු කර ගනියි.

- අංක 39 සිට 40 තෙක් ඇති එක් එක් වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන නිවැරදි වරණය තෝරන්න.

(39) රුධිර සංසරණය ආශ්‍රිතව ආසාදන සංවර්ධනය වූ රටවලටම සීමා වන්නේ නැත.

1. රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත ආසාදනවලට වැඩිපුර ගොදුරු වන්නේ සංවර්ධනය වූ රටවල් ය.
2. රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත ආසාදනවලට සංවර්ධනය වූ රටවල් බිය වීමෙහි හේතුවක් නැත.
3. සංවර්ධිත රටවල සිටින්නේ රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත ආබාධ නැති අය වීම සතුටට කරුණකි.
4. රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත ආසාදන මෙකල සමස්ත ලෝකයාටම පොදු බව සැලකේ.

(40) මානව සංහතියේ පැවැත්මට තර්ජනයක් වන ආකාරයේ පර්යේෂණ මෙහෙයවීමට පවා ඇතැම් නූතන විද්‍යාඥයෝ පෙළඹී සිටිති.

1. ඇතැම් නූතන විද්‍යාඥයින්ගේ පර්යේෂණ මිනිස් වර්ගයාගේ සුබසාධනයට යොමු නොවීම අභාග්‍යයකි.
2. සමහර නූතන විද්‍යාඥයෝ මිනිස් වර්ගයාගේ පැවැත්මට හානි කරවිය හැකි පරීක්ෂණවලද නියුක්ත වෙති.
3. නූතන විද්‍යාඥයින් සිය පර්යේෂණ යොමු කළ යුතුයේ ත් මිනිස් සංහතියේ පැවැත්මට පිටිවහලක් වන පරිදි ය.
4. නව විද්‍යාත්මක පර්යේෂණ වල අභිමතාර්ථය විය යුත්තේ මිනිස් සංහතියේ පැවැත්මට ඇති බාධා ඉවත් කිරීම යි.